# භික්ෂුව හා විසි එක්වන (21) සියවස.

**මහාචාර්ය කඹුරුපිටියේ අරියසේන හිමි.**

වර්තමාන ලෝකයේ පවත්නා ආගමික පූජ්‍ය පූජක සංවිධාන අතුරින් ව්‍යවස්ථා මාලාවක් සහිත පැරණිතම සංවිධානය බෞද්ධ භික්ෂූන්ගේ සංවිධානය ලෙස සලකනු ලැබේ. මෙම සංවිධානය අවුරුදු දෙදහස් පන්සියයකට අධික කාලයක් භාරතය ප්‍රමුඛ ආසියාතික රටවල අඛණ්ඩව පැවැතියේ, එය මධ්‍ය අධිකාරයක පාලනයකට යටත් නොවී ආවාසියක ජීවිතය පදනම් කොට ගත් ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම අනුව පාලනය වූ නිසාය. ආවාසය, හෙවත් සමාන සංවාසික සීමාව, භික්ෂූන් ගේ ජන පදයකට සමාන කළ හැකි ය. එහි පරිපාලනය අධිකරණය හෙවත් ශික්ෂණය ආදිය පිළිගත් නිශ්චිත විධි - විධානයනට අනුකූල ව පවත්වා ගෙන යනු ලැබී ය.

මේ අනුව, බෞද්ධ භික්ෂුව ගේ පෞද්ගලික ජීවිතය ශික්ෂණය කොට ක්‍රමික ව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය නීති. රීති මාලාව ප්‍රාතිමොක්ෂය නමින් ද, උන්වහන්සේගේ සාමූහික චර්යා පද්ධතිය- සමාජ ජීවිතය සංවිධානය කරන ආශ්‍රමීය සංස්ථා පද්ධතිය ඛන්ධක නමින් ද, භික්ෂුවගේ දෛනික චර්යා සංස්කරණය කොට ඒ සඳහා මග පෙන්වන, රෙගුලාසි මාලාව සෙඛියා නමින් ද විනය පිටකයෙහි හඳුන්වා දී ඇත. 'විනය පිටකය' යනු සංඝ සමාජයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

මීට අමතර ව, සංඝ සංවිධානයේ ඇතිවූ කාලීන වෙනස්කම් නිසා, 'කතිකාවත්' නමින් හඳුන්වනු ලැබූ, ඒ ඒ නිකායට අයත් පොදු ප්‍රතිපත්ති ප්‍රකාශන මාලාවක් ද දක්නට ඇත. මෙම දීර්ඝ කාලයක් තුළ පැවැති ඓතිහාසික වෙනස්කම් මැද වුව ද සංඝ සමාජය අඛණ්ඩව පැවැතියේ එහි දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිපත්ති හා මධ්‍ය අධිකාරයකින් පාලනය නොවීම ද යන මූලික සාධක නිසා ය.

ක්‍රි:පූ: 6 වන ශතවර්ෂයේ සංඝ සමාජයේ ආරම්භයේ සිට, වර්තමාන කාලය තෙක් වූ, දීර්ඝ කාලයක් තුළ, සංඝසමාජය විවිධ සමාජ, දේශපාලන හා ආර්ථික සාධක හා දර්ශනික කරුණු පදනම් කොට ගෙන විවිධ විපර්යාසයනට භාජනය වූ බව එහි ඉතිහාසයෙන් පෙනේ. මෙම පරිවර්තනයට අනුව, ඇති වූ සංඝ සංවිධාන ක්‍රමය 'නිකාය' යන නාමයෙන් හඳුන්වනු ලැබේ.[1]

බෞද්ධ භික්ෂුව ගේ ආර්ථික ජීවිතය පරපටිබද්ධය, හෙවත් පරතන්ත්‍රය, නැතහොත් සමාජබද්ධ ය. මේ නිසා ඔහු සමාජය සමග සම්බන්ධවී මෙහිදී බහුජන හිතවාදියකු විය යුතු ය.[2] දේශ පාලනයට සම්බන්ධ වීමෙහි දී ධාර්මික හෙවත් යුක්ති සහගත රාජ්‍ය නීතියට අනුකූල විය යුතු ය.[3] සංස්කෘතිය හෙවත් මානව චාරිත්‍රයන් ගේ සංවිධානය පිළිබඳ ප්‍රශ්නවලදී බෞද්ධ ආචාර විද්‍යාවේ මූලධර්ම පදනම් කොටගත් අත්ත - පර හෙවත් පුද්ගලයා හා සමාජය අතර සමතුලිත සම්බන්ධත්යක් ගොඩ නංවාගත යුතු ය.

බුදුසමය තුළ අංග සම්පූර්ණ දර්ශනයක් දක්නට ලැබෙන බව බුද්ධිමතුන් ගේ විශ්වාසයයි. ඒ අනුව, එහි සමාජ හා දේශපාලන දර්ශනයක් ද සංක්ෂිප්ත ආර්ථික දර්ශනයක් ද ආචාර විද්‍යාවක් හා ඥානමීමාංසාවක් (elristemology) ද සෞන්දර්යය පිළිබඳ මතයක් ද දක්නට ඇත.

විසි එක්වන ශතවර්ෂයට පියතබන භික්ෂූන් වහන්සේ විසින් බුදුසමයෙහි ඉගැන්වෙන මෙම මූලධර්මයනට අනුකූල චින්තන ක්‍රමය අනුගමනය කරමින්, එය තුලනාත්මක ව අධ්‍යයනය කොට වර්තමාන සමාජයට මුහුණ දී නූතන ජාතික හා අන්තර්ජාතික ප්‍රශ්න විවරණය කොට බැලිය යුතු ය.

බුදුසමයෙහි එන සමාජ දර්ශනයට අනුව 'සියලුම මනුෂ්‍යයෝ සමානයහ.'[4] යන සංකල්පය පදනම් කොට ගෙන ගොඩනංගා ඇත. සමාජයේ ප්‍රභවය හා විකාශනය ආර්ථික හා මානසික සාධක මත පරිණාමයට පත්වන ආකාරය අග්ගඤ්ඤ සූත්‍රයෙහි පැහැදිලි කොට ඇති නිසා දේව නිර්මාණවාදී මත බෞද්ධ



භික්ෂුව විසින් ප්‍රතික්ෂේප කළ යුතු ව ඇත. මනුෂ්‍ය සමාජය නිර්මාණය කරනු ලබන්නේ ද වෙනස් කරනු ලබන්නේ ද දෙවියකු විසින් නොව මිනිසා ම යන මූලධර්මය භික්ෂුව විසින් අමතක නොකළ යුතුව ඇත. ඒ නිසා සමාජය ගැන විමර්ශනයෙහිදී මිනිසා මූලික කොට ගතයුතු අතර, ඒ සඳහා දේවසංකල්ප හෝ පාර භෞතික සංකල්ප උපයෝගී කොට නො ගත යුතු ය.

බෞද්ධ භික්ෂුවකට දේශපාලන පක්ෂයක සාමාජිකයකු වී ප්‍රායොගික දේශපාලනයෙහි ක්‍රියාකාරීවීම අනුචිත නමුදු බුදුසමයෙහි එන දේශපාලන දර්ශනය ප්‍රචාරය කිරීම කිසිසේත් නුසුදුසු නොවේ. බෞද්ධ දේශපාලන දර්ශනය බෞද්ධ ආචාරවිද්‍යාව පදනම් කොට ගොඩනංවා තිබීම එයට හේතුවයි.

බුදුසමයේ එන දේශපාලන දර්ශනය ගොඩනංවා ගැනීමට අවශ්‍ය මූලධර්ම දීඝනිකායේ අග්ගඤ්ඤ කූටදන්ත හා චක්කවත්තිසීහනාද සූත්‍රයන්හි දක්නට ලැබේ. මෙම සූත්‍ර බෞද්ධ දේශපාලන සංකල්ප ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධකාලීන භාරතීය ජනයාට තේරුම් ගත හැකි අයුරු කථා, සංවාද, ප්‍රවාද හා උපමා කථාවන් පදනම් කොට ගෙන ය. විසිවන ශතවර්ෂයේ දේශපාලන දර්ශනය හෝ දේශපාලන විද්‍යාව නූතන පාඨකයාට ඉදිරිපත් කරන ආකාරයට නොවේ. ඒ නිසා බෞද්ධ සූත්‍රයන්හි එන දේශපාලන සංකල්ප මාත්‍රය එහි සන්දර්භය අමතක නොකොට උපුටා ගෙන එය නූතන චින්තකයන් ගේ මති-මතාන්තර සමග තුලනය කොට බෞද්ධ දේශපාලන සංකල්පයන් ගැන ඇගැයීමක් කළ යුතු ය. පුරාතන භාරතයේ දේශපාලනචර්යා බෞද්ධ භික්ෂූන් විසින් විමර්ශනය කරමින් විවේචනය කළ ආකාරය බොහෝ ජාතක කථාවන්හි දක්නට ඇත. නිදර්ශනයක් ලෙස උම්මග්ග ජාතකයෙහි රජුන් මැති ඇමතිවරුන් රජ බිසෝවරුන් හා රජයේ නිලධාරීන් ද උපහාසයට ලක් කොට ඇති ආකාරය දැකිය හැකි ය.

බෞද්ධ දේශපාලන දර්ශනය ජනතා පරමාධිපත්‍යය පිළිගෙන ඊට අනුකූල ප්‍රජාතාන්ත්‍රික පාලන ක්‍රමයකට අනුබල දෙන ධාර්මික පාලන තන්ත්‍රයකි. ඒ සමග ම භික්ෂූන් සඳහා විනය

නීති පැනවීමෙහිදී බුදුන් වහන්සේ විසින් මහජන මතය[6] ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූ බවත් සංඝ සමාජය ද ප්‍රජාතාන්ත්‍රික පදනමක් මත ගොඩ නගා ඇති බවත් භික්ෂුව විසින් අමතක නොකළ යුතුව ඇත. බෞද්ධ භික්ෂුවගේ ආර්ථික ජීවිතය පරතන්ත්‍රය, හෙවත් පරපටිබද්ධය. එසේ වුව ද බුදුසමයේ එන ආර්ථික දර්ශනය ක්‍රියාවට නැංවීම සඳහා මහජනයාට කරුණු පැහැදිලි කිරීම බුදුන් වහන්සේ විසින් තහනම් කොට නැත. මේ නිසා බෞද්ධ ආර්ථික දර්ශනයේ මූලධර්ම විවරණය කරන කූටදන්ත සූත්‍රය මාතෘකා කොට ගෙන ධර්ම දේශනා පැවැත්වීම අතිශයින් ම සුදුසු ය. එහි දී වර්තමාන ලෝකයේ දැනට පවත්නා නූතන ආර්ථික ප්‍රතිපත්ති සමග බෞද්ධ මූලධර්ම තුලනය කිරීම අවශ්‍ය නිසා නූතන ආර්ථික ප්‍රතිපත්ති ගැන ද සාමාන්‍ය අවබෝධයක් තිබිය යුතු ය. කූටදන්ත, සූත්‍රය චක්කවත්තිසීහනාද ආදී සූත්‍ර තුලනය කරමින් කියවන විට පෙනී යනුයේ බෞද්ධ ආර්ථික දර්ශනයට අනුව, රජයේ පුරෝගාමීත්වය හා අධීක්ෂණය සහිත ව පුද්ගලයන් විසින් විවිධ ව්‍යාපාර ආරම්භ කොට නිෂ්පාදනය හා බෙදා හැරීම ද කළ යුතු බව ය. මෙහි දී රජය මැදිහත් වනුයේ සමාජ සාධාරණය ආරක්ෂා කිරීම සඳහා වන අතර, එයින් පුද්ගලයා ගේ ආරම්භක ව්‍යායාමයට බාධා සිදු නොවිය යුතු බව සැලකිය යුතු ය.

බුදුසමය ආර්ථික සංවර්ධනයට බාධාවක්ය යන මිථ්‍යාමතයක් ඇතැම් අය අතර පවතී. එම මතය අසත්‍යයක් බව ඔප්පු වනුයේ පුරාතන ලංකාවේ වාරිමාර්ග පද්ධතියට හා කෘෂිකාර්මික සංවර්ධනයට බුදුසමයෙන් හා බෞද්ධ භික්ෂූන්ගෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව විමසා බැලීමෙහි දී ය. ක්‍රි:ව: 5වන ශතවර්ෂයේ දී රටේ කෘෂිකාර්මික ව්‍යාපාරයනට භික්ෂූන් උපදෙස් හා අනුබල දුන් ආකාරය සුමංගල විලාසිනියේ කූටදන්ත සූත්‍ර වර්ණනාවෙන් ද පැහැදිලි වේ. මේ අනුව, භික්ෂුව ආර්ථික අංශයෙන් පරපටිබද්ධ වුවද රටේ සංවර්ධනය සඳහා ධර්ම දේශනා කිරීම භික්ෂුවගේ කාර්ය භාරයෙන් වෙන්කළ නො හැකි ය. පුරාතන ලෝකයේ



ශාස්තෘන් අතරෙන් මිනිසා හා ආර්ථිකය අතර ඇති සම්බධය බුදුන්වහන්සේ විසින් තරම් වෙනත් කිසිම ශාස්තෘවරයකු විසින් ඉදිරිපත් කොට නැති බව බුද්ධ දේශනා හා වෙනත් ආගමික ග්‍රන්ථ සංසන්දනය කොට බැලීමෙන් දත හැකි ය.

බුදුසමයෙහි එන ආචාරවිද්‍යාව වර්තමාන සමාජයේ ජීවත්වන භික්ෂුවගේ විශේෂ අවධානයට ලක්විය යුත්තකි. මෙම ආචාර විද්‍යාත්මක න්‍යායය හෙවත් මූලධර්මය අම්බලට්ඨිකා රාහුලොවාද සූත්‍රයෙහි ඉදිරිපත් කොට ඇත. ඒ අනුව, කිසිවකුගේ යම්කිසි ක්‍රියාවක පුද්ගලයාට (=තමාට - අත්ත) හෝ අනුනට -සමාජයට-පර) හෝ හානියක් වේ නම් එය බෞද්ධ ආචාර විද්‍යා මූලධර්මයනට පටහැණි නොකළ ක්‍රියාවක් සේ සලකනු ලැබේ.

මේ අනුව, පුද්ගලයාට හා සමාජයට ද හිතකර ලෙස ක්‍රියා කිරීමට පෙළඹවීම බෞද්ධ භික්ෂුවගේ යුතුකම ය. සංස්කෘතිය යනු චාරිත්‍රයන්ගේ හෙවත් කළයුතු ක්‍රියාවන් ගේ සංවිධාන යැයි ගත්විට බෞද්ධ සංස්කෘතිය පුද්ගල - සමාජ යන අංශ දෙකට ම හිතකර ලෙස පවත්වා ගෙන යා යුතු ව ඇත. මෙහිදී කුල භේදය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීමට භික්ෂුව වග බලාගත යුතු ය. බුදුසමයෙහි ඥනවිභාගයක් හෙවත් ඥනමීමාංසාවක් ඇත.[7] ඇතැම් දේව නිර්මාණවාදී ආගම්වල එන ඥනය (Knowledge) පිළිබඳ මතවාද විද්‍යාවේ සංවර්ධනයට බෙහෙවින් ම බාධාකරන සුළු ය. එවැනි ආගම් අදහන රටවල විද්‍යාව දියුණු වූයේ විද්‍යාඥයන් දේවනිර්මාණවාදය ප්‍රතික්ෂේප කොට එම ආගම්වල යන ඉගැන්වීම්වලට විරුද්ධ ව ක්‍රියා කිරීම නිසා ය. එහෙත් බුදුසමයෙහි විද්‍යාත්මක චින්තනයට හෝ විද්‍යාත්මක මානසික තත්වයක් ඇතිකර ගැනීමට හෝ පටහැණි ඉගැන්වීම් දක්නට නැත. මේ බව අංගුත්තර නිකායේ එන කාලාම සූත්‍රය හා මජ්ඣිම නිකායේ චූල්ලහත්ථිපදෙපම සූත්‍රය ආදියෙහි නිර්දිෂ්ට පරීක්ෂණ නිරීක්ෂණ හා සම්පරීක්ෂණ විධි විමසීමෙන් ඔප්පුකළ හැකි ය. මෙවැනි ක්‍රමයක් ලෝකයේ වෙනත් කිසිම ආගමක උගන්වා නැති අතර, බුදුසමයෙහි නිර්දිෂ්ට මෙම ක්‍රමය නූතන ලෝකයේ පිළිගන්නා ලද විද්‍යාත්මක ක්‍රමයට (Scientifical

method) බෙහෙවින් ම අනුකූල බව ප්‍රකාශ කළ යුතුව ඇත. එබැවින් 21 වන සියවසට පිය නගන බෞද්ධ භික්ෂුවට මේ ගැන පැහැදිලි අවබෝධයක් තිබිය යුතු ය.

විද්‍යාවේ ප්‍රායෝගික ප්‍රතිඵලය වනුයේ තාක්ෂණයයි. තාක්ෂණය දියුණුවීමත් සමගම මුළු ලෝකයේ ම වාගේ නව සංස්කෘතියක් ඇති වී තිබේ. මෙම නව සංස්කෘතිය කාර්මික ශිෂ්ටාචාරය යන නමින් හඳුන්වනු ලැබේ. වර්තමාන කාර්මික ශිෂ්ටාචාරය, ලෝකයේ බොහෝ සාම්ප්‍රදායික සංස්කෘතීන් අභිභවනය කරමින් පැතිරී යමින් පවතී.

මේ නිසා ලෝකයේ බොහෝ රටවල සාම්ප්‍රදායික සමාජ සම්බන්ධතා පද්ධතිය බිඳවැටෙමින් පවතින අතර බොහෝ සමාජයන් හි පිළිගත් සාරධර්මයන් ද වෙනස් වෙමින් පවතී. මේ අනුව, විද්‍යාවේ හා තාක්ෂණයේ සංවර්ධනයත් සමග සමාජ ආකල්පයන් ගේ මූලික වෙනසක් ද ඇති වෙමින් පවතී. මෙය සමාජ විද්‍යාඥයන් හඳුන්වන්නේ ඓහලෞකිකකරණය (eculartation) යන නාමයෙනි. මෙයින් අදහස් කරනු ලබන්නේ ලෝකයේ සිදුවන ස්වාභාවික සිද්ධීන් තේරුම් කිරීමෙහිදී ආගමික සංකල්ප බැහැර කොට විද්‍යාත්මක මත පදනම් කොට ගෙන ඒවා තේරුම් කරලීම ය. නිදර්ශනයක් ලෙස ගංවතුර, ඉඩෝරය හා වසංගතරෝග ආදිය ඇතිවනුයේ දේව කෝපයෙන් නොව ස්වභාවධර්මයේ වෙනස්වීම් නිසා යැයි අවබෝධ කරලීමයි. මෙහිදී බොහෝ ආගම් දුෂ්කර ප්‍රශ්න වලට මුහුණ පාන නමුදු, ථෙරවාදී බුදුසමයේ එන ඉගැන්වීම්වලට අනුව බෞද්ධයනට එවැනි දුෂ්කරතාවයනට මුහුණ පෑමට සිදු නොවන බව ය. මෙයට හේතුව බුදුසමය යථාර්ථවාදී දර්ශනයක් වීමයි. පාරභෞතික (metaphysical) සංකල්ප හෙවත් අධිවුත්තිපද[8] බුදුසමයෙහි ප්‍රතික්ෂිප්ත කොට ඇත. මේ නිසා වර්තමාන භික්ෂුව ගේ මූලික අවධානය යොමුවිය යුතු වන්නේ තමා ළඟ එන 21 වන ශතවර්ෂයට මුහුණ දෙන්නේ කෙසේ ද? යන ප්‍රශ්නය ගැනයි.

ක්‍රි:පූ: 4 වන සියවසේ පමණ සිට සංඝ සමාජයෙහි නිකාය භේද ඇතිවීමෙන් ඊට අනුකූල සංවිධාන ක්‍රම ද ආගමික හා දර්ශනික මතභේද ද සංඝයා අතර පහළවීම ආරම්භ විය[9] ක්‍රි:පූ: 3 වන ශතවර්ෂයේ පැවැති විවිධ ආගමික හා දර්ශනික මත කවරේ ද? යන්න කථාවත්ථුප්පකරණ යෙන් පැහැදිලි වේ.



බෞද්ධ සංඝ සමාජයේ මුල් යුගයේ ඉතිහාසයට අනුව, ශාක්‍ය පුත්‍රීය ශ්‍රමණයන් ප්‍රාග්-බෞද්ධ අනගාරිකයන් අතර භාවිතවූ පාරම්පරික ආගමික හෝ සමාජ සංස්ථාවන් ඒ අයුරින් ම අනුකරණය නොකළ බව පෙනේ. එසේ වුව ද මහජන මතයේ බලපෑම නිසා, ඇතැම් විට ඒවා සුදුසු පරිදි බෞද්ධ ස්වරූපය දීමෙන් සංස්කරණය කොට පිළිපැදීම බුදුන් වහන්සේ අනුමත කළහ. නිදර්ශන ලෙස, උපෝසථය හා වස්සූපනායිකය දැක්විය හැකි ය. මෙසේ මහජන මතය ගැන සැලකිල්ලක් දක්වා ක්‍රියාකිරීම අනුමත කෙළේ නො පැහැදුණු අය ගේ පැහැදීම අපේක්ෂාකළ නිසා ය. මෙහි දී මහජන මතය සැලකිල්ලට ගතයුතු අතර එය අන්ධ ලෙස පිළිගැනීමක් බුදුන් වහන්සේ විසින් අනුමත නොකළ බව ද පිළිගත යුතුව ඇත.

බුද්ධකාලීන ශ්‍රමණ, මුනි ආජීවක පරිබ්‍රාජක ආදි අනගාරිකයන් අතරින් මහාවීරතුමා ගේ ජෛන ශාසනය විශේෂත්වයක් ඉසිලී ය. බ්‍රාහ්මණ හා බෞද්ධග්‍රන්ථයන්හි මෙන්ම ජෛන ආගමික ග්‍රන්ථයන්හිද ආචාර්ය, උපාධ්‍යාය, ආචාරිය, උපජ්ඣාය, ආචරිය, උපජඣාය යන සංඥා නාමයන් දක්නට ඇත.

බෞද්ධ භික්ෂුව බ්‍රාහ්මණ පූජකයා මෙන් කුලභේදවාදී - වර්ණශ්‍රමධර්මවාදී හෝ ශ්‍රැතිබද්ධ වූවෙක් නොවේ. එසේම ජෛනසාධුවරයා මෙන් අතත් කිලමථානු යොගියකු ද නොවන අතර ඇතැම් ආගම්වල මෙන් දෙවියන් හා මිනිසා ද අතර අතරමැදියකු වී යාඥා-කන්නලව් හෝ පුද-පූජා කරන්නෙක් ද නොවේ. මේ නිසා බොහෝ ආගම්වල මෙන් නොව භික්ෂුව පෘථුල ලෙස සමාජය හා සම්බන්ධ වී ඇත. භික්ෂුව හා සමාජය අතර සම්බන්ධයේ පදනම දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වා ඇත. ඒ අනුව ගිහියා දැනුවත් කිරීම (අස්සුතංසාවෙති) භික්ෂුවගේ මූලික යුතු කමකි.

පැරණිතම බෞද්ධ භික්ෂු සංවිධානයේ පදනම හෙවත් ඒකකය (Unit) ගුරු-ශිෂ්‍ය සම්බන්ධය නොව, භූමි ප්‍රදේශයක් මායිම් කොට පවතින ආවාස-ආරාම කිහිපයකින් යුක්ත ස්ථා නයකි. මෙය 'සමාන සංවාසික සීමා' නමින් හැඳින්විණ සැබවින් ම එය භික්ෂුජනපදයකි. මෙම භික්ෂුජනපදයේ සංවිධාන ක්‍රමය

හා එහි ක්‍රියාකාරිත්වය මහාවග්ග පාලියෙහි විස්තර කොට ඇත. මෙම පුරාතන භික්ෂුවගේ සාමූහික ජීවිතය සීමිත සංඛ්‍යාවකට පමණක් සීමා වී තිබෙනු දක්නට හැකි ය.

වස්සාවාසය සංඝසමාජයේ සංවිධානය කෙරෙහි බෙහෙවින් බල පෑ චාරිත්‍රය වූවා පමණක් නොව[11] එය ක්‍රමයෙන් ආරාමික සංස්ථාවක් බවට පත්වී භික්ෂූන් ගේ ජනපදචාරිකා ජීවිතයේ ද අවසානය වූ බව පෙනේ. මෙසේ 'වස්විසීම' බෞද්ධ සංඝයාගේ ස්ථාවර-ආවාසික - ආරාමික ජීවිතයේ ආරම්භය ද විය. මෙහි විශේෂත්වය වනුයේ භාරතයේ අනිත් අනගාරිකයන් වර්ෂාකාලයෙන් පසුව, තමන් ගේ සුපුරුදු චාරිකාවේ යෙදුණු අතර, බෞද්ධ භික්ෂුව පමණක් අසල් වැසියන් සමග සම්බන්ධතා ඇතිකර ගනිමින් ඒ ඒ ස්ථානවල නේවාසිකයන් සේ වාසය කිරීම ආරම්භ කිරීම ය. මේ නිසා අනුක්‍රමයෙන් උත්තර භාරතයේ ඒ ඒ නගර -ගම් - නියම්ගම්වල 'විහාර' ඇතිවිය 'විහාර' ශබ්දයෙන් මුල දී අදහස් කරනු ලැබුයේ එක් භික්ෂුවක් හෝ වාසය කරන කුඩා කුටි විශේෂයකැයි අනුමාන කළ හැකි ය. පසුව මෙවැනි කුටි කිහිපයක් ඒකකයක් ලෙස සලකා ආවාස සමාන සංවාසකසීමා නමින් හඳුන්වනු ලැබූ භික්ෂු ජනපද බවට පත්විය. මේ නිසා විනය පිටකයේ පෙනෙන භික්ෂු සංවිධානයේ ඒකකය, සමාන සංවාසක සීමා නමින් හඳුන්වනු ලැබූ මෙම භික්ෂුජනපද විය. ඇතැම්විට ඒවා ඒ ඒ ප්‍රදේශනාමයෙන් හඳුන්වමින් සාවත්ථියා සංඝ ආදි නම්වලින් ද හඳුන්වනු ලැබී ය. මේ අනුව, එක ආවාසයක හෙවත් සමාන සංවාසක සීමාවක සංඝයා ගේ සංවිධානය හා චර්යා පද්ධතිය අධ්‍යයනය කිරීම සමස්ත සංඝ සමාජය ම අධ්‍යයනය කිරීමක් ලෙස සැලකිය හැකි ය. විනය ප්‍රඥප්තීන් සමස්ත සංඝයාට ම පොදු ව්‍යවස්ථා සංග්‍රහය බැවිනි. එහෙත් ද්විතීය සංගීතියෙන් පසුව ඛණ්ඩසීමා නමින් හඳුන්වනු ලබන කුඩා සීමාව භාවිතයට පැමිණීමෙන් පසුව සංඝසමාජයේ සාමූහික සම්බන්ධතා ජාලය වෙනස්වී ගොස් සීමාව හා ආවාසය අතර සම්බන්ධය නැතිවී ගියේ ය.

ක්‍රි:පූ: 3 වන ශතවර්ෂයේදී අශෝක යුගයෙහි දී පුරාතන භාරතයේ බොහෝ ගම්-නියම්ගම්වල බෞද්ධ භික්ෂූන් ගේ ස්ථිර වාසස්ථාන ඇතිවිය. මේ නිසා නගරවල මෙන් විශාල



භික්ෂුජනපද ඇති නො වී ය. ඒ නිසාම **සමනසංවාසකසීමා** නමින් හඳුන්වනු ලබන මහා සීමාවල සංඝකර්ම සජීවී භාවයෙන් පවත්වා ගෙන යෑම අනවශ්‍ය විය. ඒ වෙනුවට ඒ ඒ ගම්වල පිහිටි කුඩා භික්ෂු නිවාස ආරාම බවට පත් වූ අතර කුඩා සීමාව සංඝකර්මවලදී රැස්වන ස්ථානය බවට පත්විය. අද ථෙරවාදී බොහෝ රටවල පවතිනුයේ මේ ක්‍රමයයි. මේ නිසා ආරාමවල වාසය කරන භික්ෂූන් අතර විනයානුකූල සංඝ භෙදයක් ඇතිවීම වළක්වා ගෙන ඇත.

අංගුත්තර නිකායේ ආවාසික වග්ගයේ කවර නම් වූ හෝ ආවාසයක-පන්සලක සිටින භික්ෂූන් විසින් අනුගමනය කළයුතු ප්‍රතිපත්ති පැහැදිලි කොට ඇත.

අනුරාධපුර යුගයේ අවසාන භාගයේ හා පොළොන්නරු යුගයෙහිදී ද අනතුරුව දඹදෙණි යුගයෙහි දී ද සංඝසමාජය තුළ ඇතැම් පරිහානි ලක්ෂණ දක්නට ලැබුණු අතර නුවර යුගයෙහි දී එය අන්තයට ම පිරිහිණ. මේ කාලය තුළ කතිකාවත් කිහිපයක් ම ඇති වීමෙන් මෙය මැනවින් ඔප්පු වේ. මේ කතිකාවත් සකස් කරන ලද්දේ සංඝ සමාජය පරිහානියෙන් වළක්වා ගැනීම සඳහා ය.

පෘතුගීසීන් ගේ පැමිණීමෙන් පසු (ක්‍රි:ව 1500) බොහෝ භික්ෂූන් විවිධ තාඩන - පීඩනවලට මුහුණ පෑ අතර ඇතැම්හු නිවුරු හැර දමා ගියහ. ඇතැම්හු සාමණේර භාවයට[13] පත්වූහ. මේ අතර, පෘතුගීසි - ඕලන්දයුගයන්හිදී මෙරට පැවැති ආර්ථික ක්‍රමය නිසා ඇතැම් භික්ෂූන් ද වාණිජමය ආකල්පයනට ගොදුරු වූ ආකාරය මහනුවර මල්වතුවිහාරීය කාරක සංඝ සභාව වෙත එවන ලද, **වගේ ගොඩ සන්දේශයෙන්** මැනවින් පෙනේ[14] මීට අමතරව, 1977 දී මෙරටට හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ක්‍රමය සංඝසමාජය කෙරෙහි බලපාන ආකාරය බුද්ධිමත් තරුණ භික්ෂූන්ගේ විශේෂ අවධානයට යොමු විය යුතු ව ඇත.

වර්තමානය වන විට ලක්දිව භික්ෂුසමාජය නිකාය කිහිපයකට බෙදීම්වලට පදනම වී ඇත්තේ බුදුසමයේ එන මූලධර්මනොව ලාංකික සමාජයේ ඇතිවී පවතින විවිධ හේතු - සාධකය.

සමාජය වෙනස් වී යනු ඇත. එවිට සංඝ සමාජයේ නිකාය භේදයට පදනම් වූ කරුණු ද වෙනස් වී, සංඝසමාජයේ සංවිධාන ක්‍රමය ද යම් ප්‍රමාණායකට වෙනස් වී යා හැකිය. මේ වෙනස සිදුවිය යුතුවන්නේ ජාතික අවශ්‍යතා අනුවයි. මේ වෙනස්වීම්වල ලකුණු දැනටමත් ඉස්මතුවෙමින් පවතී.

නිදර්ශනයක් ලෙස නූතන භික්ෂුසමාජය නිකාය කිහිපයකට බෙදී පවතින නමුදු, නිකාය රාමුව තුළ සිටිමින් ම සෑම නිකායකම භික්ෂූන්ගේ සහ යෝගයෙන් නිකාය සීමාව ඉක්මව ගොස් විවිධ භික්ෂු සංවිධාන පිහිටුවනු දැකීම් සුලභ ය. මෙය විශේෂ තත්වයක් වන අතර, එය ජාතික අවශ්‍යතා පදනම් කොට ගෙන ගොඩ නැංවීම අනාගත සංඝ සමාජයේ සාමාන්‍ය ලක්‍ෂණ ප්‍රකට කරන්නක් සේ ද දැක්විය හැකි ය. මේ අනුව එක්සත් භික්‍ෂු පෙරමුණ, දේශ ප්‍රෙමීභික්‍ෂු පෙරමුණ, ත්‍රෛනිකායික සංඝසභා සාසනාරක්‍ෂක මණ්ඩල හා ජාතික සංඝසභාව ආදි සංවිධාන ඇතිවී ඇත. එසේ වුව ද මෙම සංවිධාන තුළ ඍජු - හෝ වක්‍ර ලෙස එක නිකායක හෝ ගුරුකුලයක ආධිපත්‍යයට අනිත් නිකායයන් අවනත කරවා ගැනීමට ක්‍රියා කරන්නේ නම් දැන් තිබෙන සමගිය අඩපණ වී නැවත ද නිකාය භේදය අප්‍රකට - ගුප්ත ලෙස ඉස්මතුවීමෙන් සංඝසමාජයේ අනාගතය අඳුරුවීයා හැකි ය.

මේ නිසා භික්ෂූන් වහන්සසේ ආධ්‍යාත්මික පරිපූර්ණත්වය උදෙසා ක්‍රියා කරන අතර බෞද්ධ දර්ශනයේ මූලධර්ම ප්‍රචාරයකරමින් නූතන සමාජය සමග ද සම්බන්ධ වී ක්‍රියා කරන සජීවී ජීවිතයක් ගතකරන අතර බෞද්ධ විරෝධී බලවේග තෙරුම් ගනිමින් සම්බුද්ධ ශාසනය ආරක්‍ෂා කර ගැනීමට ක්‍රියා කිරීම විසි එක් වන ශතවර්ෂයට පා තබන භික්‍ෂුව ගේ අධිෂ්ඨානය විය යුතු ය.

1. Nalinaksha Dutt, Buddhist Sect in Iudia p37.

2. **අනුජානාමි භික්ඛවෙ රාජානං අනුවත්තිතුං.** රජුනට අනුවර්තනය විය යුතු යැයි මෙම විනය පාඨයෙන් කියැවෙන නමුදු බුද්ධඝොෂ අටුවාචාරීහු.



'ධම්මිකානං රාජානං' යි විශේෂණය කරමින් භික්‍ෂුව ධාර්මික හෙවත් යුක්තිසහගත රජුනට හෙවත් රජයට පමණක් අනුවර්තනය විය යුතුයැයි අර්ථය විශද කරති.

4. 1 සදිසානං යෙව නො අසදිසානං - අග්ගඤ්ඤසුත්ත.

11 චත්තාරො වණ්ණනාසම සමා - සෝණදණ්ඩ සුත්ත.

5. N. golden chilok, "man makes himself a membtor Book. 1951.

6. 'මනුස්සා උජ්ඣායති ඛීයන්ති විපාත්වෙන්නති විනයපිටක.

7. K.N. Jayatilaka, 'Early Buddhist Theory of Kanwllidge.

8. දීඝ නිකාය, බ්‍රහමජාල සූත්‍රය.

9. Nalinaksha Dutt, Buddhist Sech in Quudia P.37.

10. S.B. Deo, History of Jaima manarchism.

11. වස්සූපනායිකන්ධ කය, මහාවග්ග පාළි.

12. 'අථබො රාජගහකො සෙට්ඨි එකාහෙනෙවසට්ඨි විහාරෙ කාරාපෙසි, චූලවගග 146-159.

13. නිමල් ජේ.ගමගේ, '**ලංකා භික්‍ෂු ශාසන ඉතිහාසය. බලන්න.**

14. වඩාපෙත්වා කුක්කුටෙව කුක්කුටණේඩව නෙකථා ගාහාපෙත්වානකාජෙහි ඔලන්දං දදන්තිහ. වගේ ගොඩසන්දේශය.

LIBRARY